ADB

# විශේෂ ව්‍යාපෘති පහසුකම් සපයන්නාගේ අවසන් වාර්තාව

පොදු

ව්‍යාපෘති අංකය: 43576-013
ණය අංක: 2892 සහ 2893
ප්‍රදාන අංකය: 0303
තාක්ෂණික සහාය අංකය: 8167
2023 අගෝස්තු

## ශ්‍රී ලංකාව: පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා වර්ධන ව්‍යාපෘතිය

(පැමිණිල්ල ලද දිනය: 2017 අගෝස්තු 16)

ආසියානු සංවර්ධන බැංකුවෙහි තොරතුරු සඳහා පවතින ප්‍රවේශ ප්‍රතිපත්තියට අනුව මෙම ලේඛනය මහජනතාවට අනාවරණය කරනු ලැබේ.

Asian Development Bank

මෙම වාර්තාවේ මුල් ඉංග්‍රීසි පිටපත විශේෂ ව්‍යාපෘති පහසුකම් සපයන්නාගේ කාර්යාලය විසින් සිංහලට පරිවර්තනය කරන ලදී. යම් නොගැලපෙන අවස්ථාවකදී, ඉංග්‍රීසි පිටපත මූලික වනු ඇත.

කිසියම් රටක වැඩසටහනක් හෝ ක්‍රමෝපායක් සකස් කිරීමේදී, ඕනෑම ව්‍යාපෘතියක් මූල්‍යකරණය කිරීමේදී, හෝ මෙම ලේඛනය තුළ යම් නිශ්චිත භූමි ප්‍රදේශයක් හෝ භූගෝලීය ප්‍රදේශයක් සම්බන්ධයෙන් යම් හඳුනාගැනීමක් හෝ යොමු කිරීමක් සිදුකිරීමේදී, ආසියානු සංවර්ධන බැංකුව ඕනෑම භූමියක් හෝ ප්‍රදේශයක් සම්බන්ධයෙන් නෛතික හෝ වෙනත් තත්වයන් පිළිබඳව කිසිදු විනිශ්චයක් කිරීමට අදහස් නොකරනු ලැබේ.

## කෙටි යෙදුම්

| | |
|---|---|
| ආ.ස.බැ. | ආසියානු සංවර්ධන බැංකුව |
| ව.යා. | වගවීමේ යාන්ත්‍රණය |
| ම.ප.අ. | මධ්‍යම පරිසර අධිකාරිය |
| ලං.වි.ම | ලංකා විදුලිබල මණ්ඩලය |
| හෙ. | හෙක්ටයාර් |
| වි.ව්‍යා.ප.ස.කා. | විශේෂ ව්‍යාපෘති පහසුකම් සපයන්නාගේ කාර්යාලය |
| ද.ආ.දෙ. | දකුණු ආසියා දෙපාර්තමේන්තුව |
| වි.ව්‍යා.ප.ස. | විශේෂ ව්‍යාපෘති පහසුකම් සපයන්නා |

## සටහන

මෙම වාර්තාවේ "$" යන්නෙන් අදහස් වන්නේ එක්සත් ජනපද ඩොලර්ය.

## අන්තර්ගතය


| | |
|---|---|
| | පිටුව |
| ව්‍යාපෘති කරුණු පත්‍රිකාව | i |
| I. පසුබිම | 1 |
| A. ව්‍යාපෘතිය | 1 |
| B. පැමිණිල්ල | 1 |
| C. සුදුසුකම් තීරණය කිරීම | 2 |
| II. සමාලෝචනය සහ ඇගයීම සහ ගැටළු විසඳීම | 2 |
| A. සමාලෝචනය සහ ඇගයීම | 2 |
| B. පාර්ශවකරුවන් හඳුනා ගැනීම | 3 |
| C. ගැටළු විසඳීම | 3 |
| III. උගත් පාඩම් | 4 |
| IV. නිගමනය | 5 |

## ව්‍යාපෘති කරුණු පත්‍රිකාව

**ව්‍යාපෘතිය:** පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා වර්ධන ව්‍යාපෘතිය

**අනුමත කරන ලද්දේ:** 2012 සැප්තැම්බර් 18

**විස්තරය:** ව්‍යාපෘතිය අංග තුනකින් සමන්විතය: (i) සම්ප්‍රේෂණ යටිතල පහසුකම්; (ii) ජාල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම; සහ (iii) රටේ නැගෙනහිර, උතුරු-මැද, මධ්‍යම, උතුර, දකුණ සහ බස්නාහිර පළාත්වල නියමු වහල මත රැඳවූ සූර්ය බලශක්ති උත්පාදන ආයෝජන.

**අරමුණ:** අනාගතයේදී සැලසුම් කර ඇති පරිදි බලශක්ති සැපයුම වැඩි කිරීමට හැකිවන ලෙස සම්ප්‍රේෂණ ජාලය ශක්තිමත් කිරීමට, කලාපවල වර්ධනය වන්නාවූ ඉල්ලුම සැපිරීමට, සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව ජාලයට ඒකාබද්ධ කිරීමට මෙම ව්‍යාපෘතිය නිර්මාණය කර ඇත.

**ප්‍රතිඵලය:** ව්‍යාපෘතියේ ප්‍රතිඵල වූයේ (i) උතුරු පළාතේ සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, (ii) සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, (iii) වහල මත රැඳවූ සූර්ය බලශක්ති උත්පාදනය වර්ධනය කිරීම සහ (iv) සුළං හා සූර්ය බලශක්ති උත්පාදනය සංවර්ධනය කිරීමට ධාරිතා සහ උපදේශන සහාය.

**පීඩාවට ලක්වූ පවුල් සහ බලපෑම:** ශ්‍රී ලංකාව තුළ නව උපපොළවල් (substations) ඉදිකිරීම, දැනට පවතින උපපොළවල් උසස් කිරීම සහ වැඩිදියුණු කිරීම, සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම, බෙදාහැරීමේ ගැන්ට්‍රි (gantries) සහ ඒ ආශ්‍රිත සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම, සහ වහල මත රැඳවූ සූර්ය බලශක්ති උත්පාදන ආයෝජන යන කාර්යයන් මෙම ව්‍යාපෘතියට ඇතුළත් විය. ඉඩම් අත්පත් කර ගැනීම අවශ්‍ය වූයේ නව සම්ප්‍රේෂණ ජාල උප පොළවල් සහ බෙදා හැරීමේ ගැන්ට්‍රි (gantries) ඉදිකිරීම සඳහා පමණි.

ග්‍රිඩ් උපපොළ සහ ගැන්ට්‍රි (grid substations and gantry) සඳහා දළ වශයෙන් හෙක්ටයාර් (හෙ.) 7.70 ඉඩම් අවශ්‍ය වූ අතර, එයින් හෙ. 5.63ක් පුද්ගලික ඉඩම් වූ අතර හෙ. 2.07ක් රජයේ ඉඩමක් වනු ඇත. පුද්ගලික ඉඩම් යටතට තනි තනි ගොවීන්ගේ ඉඩම් සහ රබර් වතු හිමියන්ගේ ඉඩම් ඇතුළත් විය. කුඩා ඉඩම් කොටසක් අහිමි වීම හේතුවෙන් කාන්තා-මූලික පවුල් දෙකක්ද, ඉඩම් අත්පත් කර ගැනීම/මිලදී ගැනීම හේතුවෙන් රබර් වතු හිමියන් දෙදෙනෙක්ද ඇතුළුව සමස්තයක් වශයෙන් පවුල් හයක් බලපෑමට ලක් විය.

**ආරක්ෂණ කාණ්ඩ:**

පරිසරය: B
ස්වේච්ඡාවෙන් නොවන නැවත පදිංචි කිරීම: B
ආදිවාසී ජනතාව: C

**මූල්‍ය සැලැස්ම:**

| | | |
|---|---|---|
| ප්‍රදානය 0303-SRI: පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා වර්ධන ව්‍යාපෘතිය | පිවිතුරු බලශක්ති මූල්‍ය හවුල්කාරිත්ව පහසුකම යටතේ පිවිතුරු බලශක්ති අරමුදල | ඩොලර් මිලියන 1.50 |
| ණය 2892-SRI: පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා වර්ධන ව්‍යාපෘතිය | සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් | ඩොලර් මිලියන 100 |
| ණය 2893-SRI: පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා වර්ධන ව්‍යාපෘතිය | සහනදායී සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් ණයකරනය/ආසියානු සංවර්ධන අරමුදල | ඩොලර් මිලියන 30 |
| තාක්ෂණික සහාය 8167-SRI: පිවිතුරු බලශක්ති සංවර්ධනය සඳහා හැකියා වර්ධනය | තාක්ෂණික සහාය විශේෂ අරමුදල | $900,000 |

# I. පසුබිම

## A. ව්‍යාපෘතිය

1. නැගෙනහිර සහ උතුරු පළාත්වල ජීවත්වන දිළිඳු ජනයාගේ ආර්ථික හා සමාජ තත්ත්වයෙහි විෂමතා ඉවත් කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි යොමුවූ තිරසාර අවධානයක් ශ්‍රී ලංකාවට අවශ්‍යය. අනෙකුත් සංවර්ධන හවුල්කරුවන් සමඟ එක්ව, බලශක්ති අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි යොමුවූ ආසියානු සංවර්ධන බැංකුවේ (ආ.ස.බැ.) අවධානය මගින් ශ්‍රී ලංකාවේ තිරසාර ආර්ථික වර්ධනය සහ දරිද්‍රතාවය අඩු කිරීම සඳහා විශ්වාසනීය, ප්‍රමාණවත් සහ දැරිය හැකි මිලකට ලබාගත හැකි බලශක්ති සැපයුමක් සැපයීමට දායක වේ. සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීම, බෙදාහැරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම, තාක්ෂණික පාඩු අවම කිරීම, සහ පුනර්ජනනීය බලශක්තිය සංවර්ධනය කිරීම කෙරෙහි මෙම පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වර්ධන ව්‍යාපෘතිය අවධානය යොමු කරනු ඇත.

2. ව්‍යාපෘතිය අංග තුනකින් සමන්විත විය: (i) උතුරු පළාතේ සම්ප්‍රේෂණ යටිතල පහසුකම්; (ii) සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාලයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම; සහ (iii) රටේ නැගෙනහිර, උතුරු-මැද, මධ්‍යම, උතුර, දකුණ, සහ බස්නාහිර පළාත්වල නියමු වහල මත රුඳවූ සූර්ය බලශක්ති උත්පාදන ආයෝජන. විශේෂ ව්‍යාපෘති පහසුකම් සපයන්නා (වි.ව්‍යා.ප.ස.) (Special Project Facilitator) වෙත ලැබුණු පැමිණිල්ලට විෂයවූ කරුණ වූයේ නව පොල්පිටිය විදුලි සම්ප්‍රේෂණ සංවර්ධන ඉදිකිරීම වේ.

## B. පැමිණිල්ල

3. 2017 අගෝස්තු 16 වන දින, ව්‍යාපෘතියෙන් බලපෑමට පත් පදිංචිකරුවන් අට දෙනෙකුගෙන් වි.ව්‍යා.ප.ස. වෙත පැමිණිල්ලක් ලැබෙන ලදී. එම පැමිණිල්ල ඔවුන්ගේ නියෝජිතයා හරහා ගොනු කරන ලද අතර, එකී නියෝජිතයා විසින් පැමිණිලිකරුවන්ගේ අනන්‍යතාවය රහසිගතව තබා ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී. වි.ව්‍යා.ප.ස. විසින් පැමිණිල්ල පිළිගෙන, 2017 අගෝස්තු 17 දින ලියාපදිංචි කරන ලදී. පැමිණිලිකරුවන් විසින් ඔවුන්ගේ පැමිණිල්ල වගවීමේ යාන්ත්‍රණය (ව.යා.) (Accountability Mechanism) වෙත ගොනු කිරීමට පෙරාතුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) වෙත සහ ආ.ස. බැංකුවේ ශ්‍රී ලංකා නේවාසික මෙහෙවර වෙත පැමිණිලි කර තිබුණි.

(i) 2015 මැයි මාසයේදී පැමිණිලිකරුවන් තම මූලික පැමිණිල්ල ලං.වි.ම. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට සහ හෝමාගම ප්‍රාදේශීය ලේකම් වෙත ගොනු කරන ලදී. මිනිසුන් පදිංචිව සිටින නිවාස මෙන්ම ඉඩම්වලට වියහැකි අහිතකර බලපෑම් වළක්වා ගත හැකි යැයි ඔවුන් විශ්වාස කළ විකල්ප මාර්ග ඔවුන් විසින් යෝජනා කළහ.

(ii) 2016 නොවැම්බර් මාසයේදී ඔවුන් ආ.ස.බැංකුවේ ශ්‍රී ලංකා නේවාසික මෙහෙවරට පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදී. පැමිණිල්ල විසින් කියා සිටින්නේ (i) සම්ප්‍රේෂණ මාර්ගය පිළිබඳ විරෝධතා සහ සලකා බැලිය යුතු විකල්ප මාර්ග පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරයාට සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට 2015 මැයි මාසයේ සිට වාර්තා කළ බවය. එකී පැමිණිලි සම්පූර්ණයෙන්ම නොසලකා හැර, ජනතා කැමැත්තට එරෙහිව ඉදිකිරීම් සැලසුම් ක්‍රියාත්මක වන බවටත් ඔවුන් චෝදනා කර ඇත. ඔවුන් වැඩිදුරටත් කියා සිටියේ, (ii) මෙම ව්‍යාපෘතිය මගින් ජනතාවගේ ජීවිත, දේපළ, නිවාස වලට මෙන්ම සෞඛ්‍ය සහ ආරක්ෂාවටද අහිතකර ලෙස බලපාන බවට ලං.වි.ම. වෙත වාර්තා කරන ලද පැමිණිලිවලට කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැති බවය. එසේම (iii) මාගම්මන හරහා යෝජිත මාර්ගය පටු කුඹුරු තීරු හරහා ගමන් කරන අතර එමගින් නිවාස 45 කට වැඩි ගණනක් බලපෑමට ලක්වනු ලැබේ. 2015 ජුනි මාසයේදී මාගම්මන ජනතාව විසින් විරෝධතා ව්‍යාපාරයක් පැවැත්වූ අතර ඔවුන් ඉහළ මට්ටමේ දේශපාලන බලධාරීන්ව දැනුවත් කර ඇ ත. ඔවුන් කියා සිටියේ තමන්ට ඇහුම්කන් නොදුන් බවය.

(iii) ලං.වි.ම. සහ ආ.ස.බැංකුවේ මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් තම දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳව තමන් සෑහීමකට පත් නොවන බව පවසමින් පැමිණිලිකරුවන් විසින් ආ.ස. බැංකුවේ වගවීමේ යාන්ත්‍රණයේ පැමිණිලි භාර ගැනීමේ නිලධාරියා වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදී.

4. සිය ගම්මානය වන මාගම්මන හරහා ගමන් කරන්නාවූ, විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන පොල්පිටිය පන්නිපිටිය කිලෝවෝල්ට් 220 සම්ප්‍රේෂණ මාර්ගය හේතුවෙන් පදිංචිකරුවන් 189ක් පමණ සිටින නිවාස 50කට අධික සංඛ්‍යාවක් පීඩාවට පත්වන බවට පැමිණිලිකරුවෝ චෝදනා කරන ලදී. පැමිණිලිකරුවන්ට අනුව, අදාල සම්ප්‍රේෂණ මාර්ගය ප්‍රථමයෙන් සැලසුම් කර තිබුණේ නියදගල කටුවන සහ මාවතගම මාර්ගය හරහා වන අතර ඒ අනුව 2014 වසරේ පාරිසරික බලපෑම් අධ්‍යයනයක් සිදු කරන ලදී.

5. පැමිණිලිකරුවන් විසින් වැඩිදුරටත් චෝදනා කරනු ලැබුයේ, උඩුවන හන්දියෙන් ඔබ්බට ගිය මෙන්ම, මාගම්මන හරහා නොයන විකල්ප මාර්ගයක් යෝජනා කර තිබූ බවය. ඔවුන්ට අනුව මෙය ලං.වි.ම. විසින් අනුමත කරන ලද පෙළගැස්ම වේ. කෙසේ වෙතත්, මධ්‍යම පරිසර අධිකාරිය (ම.ප.අ.) (Central Environmental Authority) මෙම විකල්ප මාර්ගය භාරගෙන නොමැත. ඒ අනුව, පැමිණිලිකරුවන් කියා සිටින ලද්දේ අවසන් පෙළගැස්මේදී අදාල සම්ප්‍රේෂණ මාර්ගය නිවාස 50 පිහිටි මාගම්මන හරහා ගමන් කළ බවය.

6. නව පෙළගැස්ම පිළිබඳව තමන්ගෙන් උපදෙස් නොගත් බව මෙන්ම තමන් දැනුවත් නොකළ බවට පැමිණිලිකරුවන් චෝදනා කරන ලදී. එසේම නව පෙළගැස්ම සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට සහ ම.ප. අධිකාරියේ වාර්තාවට ප්‍රවේශය ලබා ගැනීමට තොරතුරු පනත මත පෙත්සමක් ගොනු කිරීමට තමන්ට සිදුවූ බවට පැමිණිලිකරුවන් චෝදනා කරන ලදී. ඉදිකිරීම් කටයුතුවල නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් හෝමාගම දිසා අධිකරණයට නඩුවක් ගොනු කරන ලදී.

7. ලං.වි.ම. ව්‍යාපෘති නිලධාරීන් පැමිණිලිකරුවන්ගේ ඉඩමට ඇතුළුවී, බලහත්කාරයෙන් ස්ථාන දෙකක කුළුණු ඉදිකිරීමට උත්සාහ කළ බවටද පැමිණිලිකරුවෝ චෝදනා කරන ලදී. මාගම්මන හරහා සම්ප්‍රේෂණ මාර්ගය ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘතියෙන් නතර කරන ලෙස උසාවියෙන් ඉල්ලා ලං.වි. මණ්ඩලයට එරෙහිව අභියාචනාධිකරණයේ නඩුවක් ගොනු කිරීමට පැමිණිලිකරුවන් පෙළඹවූයේ මෙම සිද්ධිය බව පවසනු ලැබේ.

## C. සුදුසුකම් තීරණය කිරීම

8. විශේෂ ව්‍යාපෘති පහසුකම් සපයන්නාගේ කාර්යාලය (වි.ව්‍යා.ප.ස.කා.) (Office of the Special Project Facilitator) විසින් පැමිණිල්ල සුදුසු තත්වයේ පවතින බව තීරණය කිරීම සඳහා ලැබුණු ලියකියවිලි සමාලෝචනය කර, පැමිණිලිකරුවන් සහ අදාළ ආ.ස.බැංකු ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී.

9. 2012 ව.යා. ප්‍රතිපත්ති වල සඳහන් සුදුසුකම් නිර්ණායක පදනම්ව පැමිණිල්ල පරීක්ෂා කිරීමෙන් පසුව සහ පැමිණිලිකරුවන්ගේ මෙන්ම මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ලේඛන සහ තොරතුරු මත, එය ගැටළු විසඳීමේ ක්‍රියාවලිය සඳහා සුදුසුකම් ලබන බවට වි.ව්‍යා.ප.ස. විසින් 2017 සැප්තැම්බර් 13 දින තීරණය කරන ලදී.

# II. සමාලෝචනය සහ ඇගයීම සහ ගැටළු විසඳීම

## A. සමාලෝචනය සහ ඇගයීම

10. වි.ව්‍යා.ප.ස.කා. විසින් 2017 ඔක්තෝබර් 23 සිට 30 දක්වා ශ්‍රී ලංකාව වෙත සමාලෝචන සහ ඇගයීම් මෙහෙයුමක් ඉදිරිපත් කරන ලදී. මෙම මෙහෙයුම (i) පැමිණිල්ලේ ඉතිහාසය විමසා බලන ලදී, (ii) ප්‍රධාන පාර්ශවකරුවන් තහවුරු කර ගන්නා ලදී, (iii) පැමිණිල්ලේ සඳහන් ප්‍රධාන කරුණු හඳුනා ගන්නා ලදී, (iv) ඒකාබද්ධව ගැටළු-විසඳීම සඳහා පාර්ශ්වකරුවන්ගේ සූදානම මෙන්ම බේරුම්කරණය සඳහා පවතින ප්‍රායෝගික විකල්ප විමසා බලන ලද අතර (v) ක්‍රියාමාර්ගයක් නිර්දේශ කරන ලදී. ආ.ස. බැංකුවේ දකුණු ආසියා දෙපාර්තමේන්තුව (ද.ආ.දෙ.) (ADB South Asia Department), ශ්‍රී ලංකා නේවාසික මෙහෙවර, ලංවිම, ම.ප.අ. සහ පැමිණිලිකරුවන් සමඟ සාකච්ඡා මෙම සමාලෝචන සහ ඇගයීමට ඇතුලත් වන ලදී.

## B. පාර්ශවකරුවන් හඳුනා ගැනීම

11. පාර්ශ්වකරුවන් අතරට (i) පැමිණිලි ලිපියට අත්සන් කර ඇති පැමිණිලිකරුවන් අට දෙනා, මාගම්මන ප්‍රදේශයේ පදිංචිකරුවන්, සහ ව්‍යාපෘතියෙන් බලපෑමට පත් වූවන්, සහ (ii) ව්‍යාපෘතිය ක්‍රියාවට නඟන්නාවූ ආයතනය, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, ක්‍රියාත්මක කරන ආයතන, ලං.වි.ම., සහ ම.ප.අ. ඇතුළත් වන ලදී.

12. හඳුනාගත් අනෙකුත් පාර්ශ්වකරුවන් අතරට ආ.ස. බැංකුවේ ද.ආ.දෙ. සහ නේවාසික මෙහෙයුම යන දෙපාර්ශවයෙන්ම ව්‍යාපෘතියට සම්බන්ධ ආ.ස. බැංකුවේ කාර්ය මණ්ඩලයද ඇතුළත් වන ලදී.

## C. ගැටළු විසඳීම

13. වි.ව්‍යා.ප.ස. කාර්යාලයේ 2017 ඔක්තෝබර් 23-30 මෙහෙයුම අතරතුර, සියලු ශක්‍යතාවයෙන් යුතු පෙළගැස්මවල් පිළිබඳ ස්වාධීන විකල්ප ඇගයීමක් කිරීමට දෙපාර්ශවය (ලං.වි.ම. සහ පැමිණිලිකරුවන්) එකඟ විය. වි.ව්‍යා.ප.ස.කා., ආ.ස. බැංකුවේ ද.ආ.දෙ., සහ නේවාසික මෙහෙයුම විසින් පහත ක්‍රියාමාර්ග කෙරෙහි අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වන ලදී.

(i) ලං.වි.ම., ආ.ස. බැංකුවේ ව්‍යාපෘති කණ්ඩායම සමඟ එක්ව විකල්ප පෙළගැස්වීම් ඔස්සේ තාක්ෂණික අධ්‍යයන (ඉංජිනේරු ශක්‍යතා) සිදු කරනු ලැබේ.

(ii) ආ.ස. බැංකුවේ ද.ආ.දෙ. විසින් උපදේශකයින්ගේ සහාය ඇතිව, විකල්ප පෙළගැස්ම පිළිබඳ පාරිසරික සහ සමාජ ආරක්ෂණ ඇගයීම් කිරීම් සිදු කරනු ලැබේ. එසේම ආ.ස. බැංකුවේ ආරක්ෂක ප්‍රතිපත්ති සහ ජාතික රෙගුලාසි වලට අනුකූල වීම සහතික කිරීම වෙනුවෙන් පාර්ශවකරුවන් සමඟ අර්ථවත් ලෙස උපදේශන පැවත්වීම සහතික කරනු ලැබේ.

(iii) සමස්ත ක්‍රියාවලියට සහය දැක්වීමට මෙන්ම උපදේශන අධීක්ෂණය සඳහා වි.ව්‍යා.ප.ස.කා. විසින් ස්වාධීන විශේෂඥයෙකු සිය නියෝජිතයා ලෙස ක්‍රියාකිරීමට යොදවනු ලැබේ.

(iv) විකල්ප පෙළගැස්වීම් සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම සඳහා තාක්‍ෂණිකව, පාරිසරිකව, සහ සමාජීය වශයෙන් වඩාත්ම ශක්තිමත් පෙළගැස්වීමේ විකල්පය පිළිබඳ අන්‍යෝන්‍ය අවබෝධයක් ලබා ගැනීමට 2018 පළමු කාර්තුවේදී බහුපාර්ශ්වික උපදේශනයක් සංවිධානය කරනු ලැබේ.

14. වි.ව්‍යා.ප.ස. කාර්යාලයෙහි උපදෙස් මත, එකඟතාවකට පැමිණෙන තෙක් මාගම්මන හරහා කොටසේ ඉදිකිරීම් අත්හිටුවීමට කටයුතු කරන බව ලං.වි.ම. විසින් යලි තහවුරු කරන ලදී. ඉන් පසුව වි.ව්‍යා.ප.ස.කා. විසින්, නේවාසික මෙහෙයුමේ සහාය ඇතිව, ස්වාධීන විශ්ලේෂණයක් සිදු කිරීම සඳහා උපදේශකයින් බඳවා ගත් අතර පවතින විකල්ප තක්සේරු කිරීම සඳහා සවිස්තරාත්මක සැලැස්මක් සහ උපදේශන ක්‍රමෝපායක් සකසන ලදී.

15. මෙම අවස්ථාවෙහිදී, විකල්ප පෙළගැස්වීම් පිළිබඳ කරනු ලබන අධ්‍යයනය කෙරෙහි පවතින අවබෝධය සම්බන්ධයෙන් ලං.වි.ම. විසින් වි.ව්‍යා.ප.ස.කා. සමඟ ගැටළුවක් මතු කරන ලදී. එකී ක්‍රියාමාර්ගය ගනු ලැබුවේ නම්, ලං.වි.ම. විසින් සකස් කරන ලද පූර්ව තක්සේරුව නිසියාකාරව සිදු කර නොමැති බවත් එබැවින් සවිස්තරාත්මක තක්සේරුවක් කිරීමට ආ.ස. බැංකුව තීරණය කර ඇති බව පෙන්නුම් කරනු ඇතැයි යන කාරණය ලං.වි.ම. කනස්සල්ලට හේතු විය. ඒ අනුව, එවැනි තක්සේරුවක් සිදු කිරීමෙන් අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතින කාරණා සම්බන්ධයෙන් ලං.වි.ම. පවත්වාගෙන යනු ලබන ස්ථාවරයට හානියක් නොවන බව වි.ව්‍යා.ප.ස.කා. විසින් තහවුරු කරන්නේ නම් මිස, විකල්ප තක්සේරුව සඳහා සහාය නොදෙන බව ලං.වි.ම. විසින් වි.ව්‍යා.ප.ස.කා. වෙත දැනුම් දෙන ලදී.

16. ගැටළු විසඳීමේ ක්‍රියාවලියෙන් කිසිදු පාර්ශ්වයක් පැහැදිලිවම ඉවත් වී නොමැති බැවින්, වි.ව්‍යා.ප.ස.කා. විසින්, එහි නීතිරීතිවලට අනුකූලව, විසඳුමක් බලාපොරොත්තුවෙන් පැමිණිල්ල විවෘතව තබන ලදී.

17. කෙසේ වෙතත්, 2019 ජූලි මාසයේදී, වි.ව්‍යා.ප.ස.කා. විසින් පහත සඳහන් කරුණු මත පදනම්ව තමාට පැමිණිල්ල වසා දැමීමට සහ ක්‍රියාවලිය අවසන් කිරීමට සිදුවන බව මාගම්මන ප්‍රජා පාදක සංවිධානයේ සභාපතිවරයාට දන්වා සිටින ලදී: [1]

a. පැමිණිලි පාර්ශ්වයේ නීතිඥවරයාගේ ඉල්ලීම මත ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ප්‍රමාද කර තිබීම.

b. විභාග වෙමින් පවතින අධිකරණ නඩු අවසන් නොකර, විකල්ප ඇගයීම් සඳහා එකඟවූ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට ලං.වි.ම. කැමැත්තක් නොදැක්වීම.

c. විකල්ප ඇගයීම සම්පූර්ණ වන තෙක්, වි.ව්‍යා.ප.ස.කා. විසින් නිර්දේශ කරන ලද පරිදි ලං.වි.ම. සමඟ පහසුකම් සපයන ලද සාකච්ඡාවකට මාගම්මන ප්‍රජාව එකඟ නොවීම.

d. මෙම ව්‍යාපෘතිය සඳහා ආ.ස. බැංකුවේ ණය මුදල 2019 ජූනි 30 වන දින අවසන් කරන ලද අතර, 2019 ජූනි 30 වන විට අවසන් කර නොතිබූ සම්ප්‍රේෂණ මාර්ගයේ කොටස් සඳහා ආ.ස. බැංකුව මූල්‍යාධාර ලබා දෙනු නොලැබේ.

## III. උගත් පාඩම්

18. **ගැටළු විසඳීම සඳහා කාල නියමයන්.** දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණ ක්‍රියාවලියේදී සිය දුක්ගැනවිලි විසඳීම සඳහා අපේක්ෂිත කාලරාමුවක් නොතිබීම හේතුවෙන් පැමිණිලිකරුවන්ට කලකිරීමට මෙන්ම බලාපොරොත්තු සුන්වීම සඳහා පැහැදිලි හේතු තිබුණි.

19. **උපදේශනය සහ තොරතුරු අනාවරණය.** ව්‍යාපෘතියෙන් බලපෑමට පත් පුද්ගලයින් සමඟ පවත්වන උපදේශන සහ සන්නිවේදන අර්ථවත්, ගෞරවනීය, ප්‍රමාණවත්, සහ කාල පමාවකින් තොර විය යුතු වේ. මුල් පෙළගැස්වීම යොමුව තිබූ මාර්ගයේ සිටි පදිංචිකරුවන්ගේ දුක්ගැනවිලිවලට ප්‍රතිචාර වශයෙන් ලංවිම විසින් සම්ප්‍රේෂණ මාර්ග පෙළගැස්ම වෙනස් කරන ලදී. නව පෙළගැස්මට අදාල ප්‍රජාවන් සමඟ කළ උපදේශන ප්‍රමාණවත් නොවුණු අතර බලපෑමට ලක් වූ නව පිරිසට තොරතුරු බෙදා හැරීම නිසි කාලයේදී සිදු නොවිය. සම්ප්‍රේෂණ මාර්ග වල අංශ හෝ කොටස් වෙනස් වීමට හේතුව ඇතුළුව රජයේ අනුමත කිරීමේ ක්‍රියාවලීන් පිළිබඳව පැමිණිලිකරුවන්ට ප්‍රමාණවත් ලෙස සන්නිවේදනය කර නොමැත. ප්‍රමාණවත් දේශීය උපදේශනයකින් තොරව ලං.වි.ම. විසින් සම්ප්‍රේෂණ මාර්ග වෙනස් කිරීම බරපතල විරෝධතා සහ නීතිමය ක්‍රියාමාර්ග වලට හේතු වන ලදී.

20. **ආරක්ෂණ ලේඛන යාවත්කාලීන කිරීම.** පැමිණිලි ඉදිරිපත් කරන අවස්ථාවේදී, මාගම්මන හරහා ගමන් කරන සංශෝධිත පෙළගැස්ම පිළිබිඹු වන පරිදි ආරක්ෂක ලේඛන (මුල් පාරිසරික පරීක්ෂණය සහ නැවත පදිංචි කිරීමේ සැලැස්ම) යාවත්කාලීන කර නොතිබුණි. මෙම ලේඛන ආසියානු සංවර්ධන බැකුවේ වෙබ් අඩවියට ඇතුලත් කර ඇත්තේ පැමිණිලිකරුවන් වි.ව්‍යා.ප.ස.කා. වෙත සිය පැමිණිල්ල ගොනු කිරීමෙන් පසුවය. ආරක්ෂිත ලියකියවිලි නියමිත කාලයේදී යාවත්කාලීන කිරීම මගින් අලුතින් බලපෑමට පත් වූ පුද්ගලයින් සමඟ ප්‍රමාණවත් උපදේශන පැවැත්වීම සහතික කිරීමට සහ දුක්ගැනවිලි උත්සන්න වීම වළක්වා ගත හැකිව තිබුණි.

21. **පැමිණිලි කළමනාකරණය කිරීම සඳහා ක්‍රියාත්මක කරන ආයතනවල සහ ආ.ස. බැංකුවේ මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ හැකියා.** විකල්ප පෙළගැස්මක් හෝ අවම කිරීමේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පැමිණිලිකරුවන්

[1] Complaint on Loan Nos. 2892 and 2893, Grant No. 0303, and TA No. 8167 SRI: Clean Energy and Network Efficiency Improvement Project—Eligibility of Complaint and OSPF's Review and Assessment Mission, 23–30 October 2017 යන මාතෘකාවෙන් යුක්තවූ 2019 ජූලි 3 දිනැති විශේෂ ව්‍යාපෘති පහසුකම් සපයන්නා විසින් යොමුකල විද්‍යුත් තැපැල් ලිපිය.

සමඟ එකඟතාවකට පැමිණීමට ප්‍රමාද වීම හරහා පැමිණිලි හැසිරවීමේදී ක්‍රියාත්මක කරන ආයතනවල සහ ආ.ස. බැංකුවේ ව්‍යාපෘති කණ්ඩායම්වල කාර්ය මණ්ඩලයේ හැකියාවන් වර්ධනය කිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරයි.

## IV. නිගමනය

22. මූලික වශයෙන් පැමිණිලිකරුවන් විසින් පවත්වාගෙන යනු ලබන අනම්‍ය ස්ථාවරය එක් අංශයකින්ද, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මත රඳාපවතින කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමට ලං.වි.ම. විසින් පනවා ඇති තහංචි අනෙක් පැත්තෙන්ද පවතින බැවින් වි.ව්‍යා.ප.ස. කාර්යාලයට පහසුකම් සලසන ලද විසඳුමක් හරහා මෙම ගැටළුව විසඳීමට නොහැකි වන ලදී. මේ අතරතුර, ව්‍යාපෘතිය එහි අවසන් දිනය වන 2019 ජූනි 30 දිනට ළඟා වූ අතර ආ.ස. බැංකු ණය වසා දමන ලදී. ආ.ස. බැංකු මූල්‍යකරණය යටතේ ලැබෙන අරමුදල් ව්‍යාපෘතිය අවසන් වූ දිනට පසුව ලං.වි. මණ්ඩලයට වෙනත් කිසිදු ක්‍රියාකාරකමක් සඳහා භාවිතා කළ නොහැකි බැවින්, මෙම පැමිණිල්ලේ විෂය වන සම්ප්‍රේෂණ මාර්ග පෙළගැස්ම තවදුරටත් ආ.ස. බැංකුව විසින් මූල්‍යකරණය කර නොමැත. ව්‍යාපෘති අවසන් කිරීමේ වාර්තාව 2021 මාර්තු මාසයේදී නිකුත් කරන ලදී.

23. පැමිණිල්ල ආ.ස. බැංකුවේ සහාය ලබන ව්‍යාපෘතියකට තවදුරටත් සම්බන්ධ නොවන බැවින්, එය ආ.ස. බැංකුවේ ව.යා. යටතේ සලකා බැලීමට සුදුසුකම් ලබනු නොලැබේ. වි.ව්‍යා.ප.ස. විසින් සිය නිගමනය ණය ගැනුම්කරුට, ආ.ස. බැංකුවේ ව්‍යාපෘති කණ්ඩායමට සහ පැමිණිලිකරුවන්ට දැනුම් දෙන ලදී.